5 ලෝකයේ පැරණි ශිෂ්ටාචාර

හැඳින්වීම

ලෝකයේ පැවති පැරණි ශිෂ්ටාචාර පිළිබඳව 6 ශ්‍රේණියේ දී ඉගෙන ගත් බව ඔබට මතක ඇත. එම ශිෂ්ටාචාරවල වැඩි තොරතුරු ප්‍රමාණයක් මෑත කාලයේ පුරාවිද්‍යා කැනීම් මගින් සොයා ගත් ඒවා වේ. මෙහි දී අවධානය යොමු කරන ග්‍රීසිය හා රෝම ශිෂ්ටාචාර එසේ කාලයක් සාහිත්‍ය ලෝකයෙන් ඈත්ව තිබූ ඒවා නො වේ. ග්‍රීක, රෝම ශිෂ්ටාචාර මගින් නූතන යුරෝපා ශිෂ්ටාචාරය පෝෂණය ලැබීම කැපී පෙනෙන ලක්ෂණයකි. පැරණි ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරවල කැපී පෙනෙන ලක්ෂණ පිළිබඳව මෙම පාඩමෙන් අවධානය යොමු කෙරේ.

ග්‍රීක ශිෂ්ටාචාරය

පිහිටීම

බටහිරින් අයෝනියානු මුහුදටත් නැගෙනහිරින් ඊජියන් මුහුදටත් මැදිව මධ්‍යධරණී මුහුදට නෙරා පිහිටි අර්ධද්වීපය සහ ඊට දකුණින් ඇති ක්‍රීට දූපත ඇතුළු දූපත් සමූහය මුල් කරගෙන ග්‍රීක ශිෂ්ටාචාරය බිහි විය. මෙම ශිෂ්ටාචාරයට අයත් දූපත් අතරින් විශාලත ම දූපත ක්‍රීට දිවයින වේ.

ග්‍රීසිය කඳුවලින් පිරි රටකි. ඒ අතරින් අලංකාර ඔලිම්පස් කන්ද වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත. මෙම කඳු වැටි අතුරින් ගලා බස්නා ජල මාර්ග නිසා කෘෂිකර්මාන්තයට යෝග්‍ය පරිසරයක් පැවතුණි. එහි පැවති සෞම්‍ය දේශගුණය සත්ව පාලනයට මෙන් ම ජන ජීවිතයට ද හිතකර විය.



සිතියම 5.1 ග්‍රීක ශිෂ්ටාචාරය

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

කඩතොලු වූ වෙරළ ආශ්‍රිතව ස්වාභාවික වරායන් රැසක් තිබීම, පැරණි ග්‍රීසියේ විදේශ සම්බන්ධතාවලට මෙන් ම වෙළෙඳ කටයුතුවලට ද උපකාරි විය.

ග්‍රීක ශිෂ්ටාචාරයේ ආරම්භය

ග්‍රීක ශිෂ්ටාචාරය ආරම්භ වීමට පෙර ක්‍රීට දිවයින මුල් කරගෙන පැරණි ශිෂ්ටාචාරයක් පැවතුණි. එය මිනෝවන් ශිෂ්ටාචාරය ලෙස හැඳින්වේ.

අවට ප්‍රදේශවලින් විවිධ ගෝත්‍ර හා ජන කණ්ඩායම් පැමිණීම නිසා මිනෝවන් ශිෂ්ටාචාරය පරිහානියට පත් විය. එසේ පැමිණි ජන කොටස් ඉන්දු යුරෝපියානු ජන කණ්ඩායම් ලෙස සැලකේ. එම ගෝත්‍ර හා ජන කොටස් කුඩා ගම්මාන පිහිටුවා ගැනීමෙන් ක්‍රි. පූ. 2000 පමණ වන විට ග්‍රීක ශිෂ්ටාචාරය ඇරඹිණි.

පාලනය

ඉහත සඳහන් කළ විවිධ ගෝත්‍ර හා ජන කොටස් පිහිටුවූ ගම් දියුණු වී නගර බිහි විය. මෙසේ දියුණු වූ නගර ආශ්‍රිත ව ක්‍රි. පූ. 700 පමණ වන විට නගර රාජ්‍ය රැසක් බිහි විය. ග්‍රීසියේ පැවති මෙම නගර රාජ්‍ය ක්‍රමය පෞර රාජ්‍ය ලෙස හැඳින්වේ. පෞර හෙවත් පුර යනු නගරයට භාවිත කෙරෙන තවත් නමකි. එම පෞර රාජ්‍ය අතුරින් ඇතන්ස්, ස්පාටා ප්‍රධාන නගර රාජ්‍ය ලෙස සැලකේ.

මෙම පෞර රාජ්‍යවල කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් දක්නට ලැබේ.

- භූමි ප්‍රදේශය කුඩා වීම.
- ජනගහනය සීමිත වීම.
- පුරවැසියන්ට පමණක් දේශපාලන අයිතිවාසිකම් ලැබීම.

පෞර රාජ්‍යවල පුරවැසියෝ එක තැනකට රැස්ව සාකච්ඡා කොට දේශපාලන තීරණ ගත්හ. මෙසේ පුරවැසියන් තමන් ම පාලන කටයුතුවලට සම්බන්ධ වීම ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ලෙස හැඳින්වේ. එමගින් නූතන ලෝකයේ පවතින පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට පදනම වැටුණි.

පෙරික්ලීස් නම් පාලකයාගේ කාලය ග්‍රීසියේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වේ. ඔහු ඇතන්ස් නගර මධ්‍යයේ ඇති කුඩා කඳු ගැටයක ඇක්‍රොපොලිස් හෙවත් අග නගරය ඉදි කළේ ය.

පසු කලෙක ග්‍රීක පෞර රාජ්‍ය එකිනෙකා අභිභවා නැගී සිටීමට උත්සාහ කළේ ය. මේ අසමගියෙන් ප්‍රයෝජන ගත් මැසිඩෝනියාවේ පිලිප් රජු ග්‍රීසිය ආක්‍රමණය කළේ ය. ඔහුගේ හදිසි මරණින් පසු පිලිප් රජුගේ පුත් මහා ඇලෙක්සැන්ඩර් ග්‍රීසිය අල්ලාගෙන එහි රජ විය.

ක්‍රියාකාරකම

ග්‍රීසියේ සිතියම පිටපත් කරගෙන එහි ඇතන්ස්, ස්පාටා, ට්‍රෝයි, කොරින්ත් යන නගරත් ක්‍රීට දිවයින, අයෝනියානු මුහුද, ඊජියන් මුහුද හා ඔලිම්පස් කන්ද යන කඳුත් ලකුණු කර නම් කරන්න.

රූපය 5.1 ග්‍රීකවරු නිපද වූ අලංකාර මැටි බඳුන්

ආර්ථිකය

පැරණි ග්‍රීක ජන ජීවිතය, ගොවිතැන, සත්ව පාලනය හා වෙළෙඳාම මත පදනම්ව තිබුණි.

ගොවිතැන -

- ✧ තිරිඟු, බාර්ලි වැනි ධාන්‍ය හා මිදි ඔලිව් ආදිය ප්‍රධාන වගාවන් විය.

රූපය 5.2 ඔලිව් ගසක්

සත්ව පාලනය -

- ✧ ගවයන්, එළුවන්, බැටළුවන් වැනි සතුන් ඇති කරනු ලැබිණි.

වෙළෙඳාම -

- ✧ ඉන්දියාව, චීනය, ශ්‍රී ලංකාව වැනි රටවල් සමග වෙළෙඳ සම්බන්ධතා පැවැත්වී ය.
- ✧ ග්‍රීකවරුන් ශ්‍රී ලංකාව හැඳින්වූයේ ත්‍රැපොබේන් යන නමිනි.
- ✧ සුවඳ විලවුන්, අලංකාර මැටි බඳුන්, ලිනන් රෙදි, වයින් ආදිය ග්‍රීකවරුන්ගේ වෙළෙඳ භාණ්ඩ විය.

ජන ජීවිතය

පැරණි ග්‍රීක ජන සමාජය ප්‍රභූන්, සාමාන්‍ය වැසියන් හා වහලුන් යනුවෙන් පුද්ගල කොටස් තුනකින් සමන්විත විය. පවුල කුඩා ම ඒකකය විය. සරල පැවැත්මට හුරුව සිටි ග්‍රීකවරුන්ගේ ශරීර ස්වරූපය බොහෝ දුරට එක සමාන විණැයි සැලකේ.

ආහාරපාන

- ➢ එළවළු, මස්, මාළු, බාර්ලි, වයින් ආහාරපාන ලෙස භාවිතා විය.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

නිවාස

රූපය 5.3 ග්‍රීසියේ පැරණි නිවසක අනුරුවක්

- ප්‍රභූ ජනයාට මහල් නිවාස පැවතුණි.
- මැද මිදුල වටා කාමර, කුස්සිය, ගබඩා කාමර ඉදි කර තිබුණි.
- සාමාන්‍ය ජනයා කුඩා නිවාසවල ජීවත් වූහ.

රූපය 5.4 පැරණි ග්‍රීක ජනයාගේ ඇඳුම් පැලඳුම්

කලා කටයුතු

ගෘහ නිර්මාණ ශිල්පය -

- ✧ විශාල ගොඩනැගිලි හා ඉතා අලංකාර දේවස්ථාන තැනවීමට ග්‍රීකවරු සමත් වූහ.
- ✧ දේවස්ථාන තැනවීමේ දී ඔප මට්ටම් කළ හුණුගල්, කිරිගරුඬ වර්ණවත් පිඟන් ගඩොල් භාවිත කර ඇත.
- ✧ පාතිනස් දෙව්මැඳුර මෙයට හොඳ ම උදාහරණය යි.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

රූපය 5.5 පාතීනන් දෙව් මැදුරෙ පින්තූරයක්

මූර්ති හා ප්‍රතිමා

- ✧ මිනිස් සිරුරේ ස්වාභාවික බව නියම ආකාරයෙන් පෙනෙන ලෙස මූර්ති හා ප්‍රතිමා තැනවී ය.
- ✧ කවපෙත්ත විසි කරන්නාගේ ප්‍රතිමාව උදහරණයකි.
- ✧ ප්‍රතිමා නිර්මාණයේ දී ඇත් දත් හා රන් වැනි දුර්ලභ ද්‍රව්‍ය පවා භාවිත කර ඇත. ඇතීනා දෙවඟනගේ ප්‍රතිමාව ඊට උදහරණය යි.



රූපය 5.6 ඇතීනා දෙවඟන

නාට්‍ය

සුඛාන්ත හා දුඃඛාන්ත යනුවෙන් නාට්‍ය වර්ග දෙකක් පැවතුණි. ඊසිකලස්, සොපොක්ලීස්, යුරිපීඩිස් සුප්‍රසිද්ධ නාට්‍යකරුවන්ට උදහරණ වේ.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

රූපය 5.7 එළිමහන් රඟහලක්

සාහිත්‍යය

- සාහිත්‍ය පොත් පත් ලිවීමේ දී ග්‍රීක භාෂාව යොදා ගැනිණි.
- ඉතිහාස කතා, වීර කාව්‍ය උසස් සාහිත්‍ය නිර්මාණ වේ.



රූපය 5.8 හෝමර්

- හෝමර් කවියාගේ ඉලියඩ් සහ ඔඩිසි ග්‍රීක වීර කාව්‍යවලට උදාහරණ වේ.
- හෙරඩෝටස්, තියුසීඩිස්, ඇරිස්ටෝටල් ග්‍රීසියේ සිටි සාහිත්‍යකරුවෝ ය.

අධ්‍යාපනය හා දර්ශනය

අධ්‍යාපනය

විවිධ වෘත්තිකයන්, දර්ශනිකයන්, කලාකරුවන් බිහි කිරීමට සමත් දියුණු අධ්‍යාපනයක් පැවතුණි. ප්ලේටෝගේ ඇකඩමි හා ඇරිස්ටෝටල්ගේ ලයිසියම් විශිෂ්ට අධ්‍යාපන ආයතන වේ.

දර්ශනය

සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් අග්‍රගණ්‍ය ග්‍රීක දාර්ශනිකයෝ වෙති.

ග්‍රීක ජාතිකයකු වන හිපොක්‍රටීස් බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස සැලකේ.

ආකිමිඩීස් උසස් ගණිතඥයකු හා විද්‍යාඥයකු ලෙස පිළිගැනේ.

ආගම

- ✧ ග්‍රීසියේ දේව වන්දනාව වැඩි වශයෙන් දක ගත හැකි විය.
- ✧ ග්‍රීසියේ එක් එක් නගර රාජ්‍යවලට වෙන් වෙන් වූ දෙවිවරු සිටියහ.
- ✧ සියුස් දෙවියා ග්‍රීක දේව පරපුරේ ප්‍රධානියා ලෙස සැලකේ.
- ✧ සියුස්ගේ දියණියක් ලෙස සැලකෙන ඇතීනා ග්‍රීසියේ වන්දනයට පාත්‍ර වූ ප්‍රධාන දෙවඟන යි. පාතීනන් දේවස්ථානය ඇය වෙනුවෙන් ඉදි කර ඇත.

ක්‍රීඩාව

ක්‍රීඩා වර්ග

- ➢ දිවීම, බොක්සිං (මල්ලවපොර), බර ඉසිලීම, කවපෙත්ත විසි කිරීම ග්‍රීක ක්‍රීඩාවලට උදහරණ වේ.

වර්තමාන ඔලිම්පික් ක්‍රීඩාවේ ආරම්භය ග්‍රීකවරුන්ගෙන් සිදු විය. අතීතයේ සියුස් දෙවියා සිහි කිරීමට සිව් වසරකට වරක් පැවති ඔලිම්පික් ක්‍රීඩාවට සෑම පුර රාජ්‍යයක ම පුරවැසියෝ සහභාගි වූහ. ඔලිම්පික් ක්‍රීඩාව ග්‍රීකයන් අතර එකමුතුකම පිළිබිඹු කරන අවස්ථාවකි.

ක්‍රියාකාරකම

පහත මාතෘකා අනුව ග්‍රීක ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු සොයා පොතක් සකස් කරන්න.

ආරම්භය
ස්වරූපය
ලෝකයට උරුම වූ දයාද

ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දයාද

- ☆ නූතන යුරෝපය ගොඩනැගීමට අවශ්‍ය මූලික පදනම වැටුණේ ග්‍රීක ශිෂ්ටාචාරයෙනි.
- ☆ යුරෝපයේ දේශපාලනය, සාහිත්‍ය, විද්‍යාව හා කලාව බිහි වීමට ග්‍රීක ශිෂ්ටාචාරයේ ප්‍රබල දයකත්වයක් හිමි විය.
- ☆ ග්‍රීක දර්ශනිකයන් හා චින්තකයන්ගේ ඉගැන්වීම් නූතන යුරෝපා චින්තනය බිහි වීමට උපකාරී විය.
- ☆ නූතන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ලොවට උරුම වූයේ ග්‍රීකවරුන්ගෙනි.
- ☆ ඔලිම්පික් ක්‍රීඩාව ග්‍රීකවරුන්ගෙන් වර්තමාන ලොවට ලැබුණු දයාදයකි.

රූපය 5.9 කවපෙත්ත විසි කරන්නා

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

5.2 රෝම ශිෂ්ටාචාරය

පිහිටීම

ඉතාලියේ රෝම නගරය මුල් කරගෙන රෝම ශිෂ්ටාචාරය බිහි විය. ඉතාලිය යනු මධ්‍යධරණී මුහුදට නෙරා ගිය අර්ධද්වීපයකි. නැගෙනහිරින් ඇඩ්‍රියාතික් මුහුදෙන් ද බටහිරින් හා දකුණින් මධ්‍යධරණී මුහුදෙන් ද මෙම අර්ධද්වීපය වෙන්ව තිබේ. උතුරු ප්‍රදේශයෙන් පිහිටි ඇල්ප්ස් කඳු වැටිය නිසා ඉතාලිය යුරෝපයේ සෙසු රටවලින් වෙන් වේ. ඉතාලි භූමියේ රට මැදින් දිගට විහිදී ගිය, කඳුවැටියකි. එය ඇපිනයින් නමින් හැඳින්වේ. මෙම කඳු වැටියෙන් ඇරඹෙන ටයිබර් ගංගාව දිගේ රෝමයේ සිට නැව් ගමන් කළ හැකිවීම, එම නගරයේ අභිවෘද්ධියට හේතු විය.

සිතියම 5.2 රෝම ශිෂ්ටාචාරය

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ආරම්භය

රෝම ශිෂ්ටාචාරය ආරම්භ වීම පිළිබඳ මත කිහිපයක් තිබේ. යුරෝපයේ සිට ඉතාලියට පැමිණි ලතින්වරුන් රෝමය ගොඩනැගුවේ ය, යන්න එක් මතයකි. රොමියුලස් නැමැති වීරයෙකු විසින් රෝමය ගොඩනගන ලදැයි ජනප්‍රවාදයක් ද තිබේ. රෝමය අතීතයේ සිට වැදගත් වෙළෙඳ මධ්‍යස්ථානයක් වූ බැවින් වෙනත් පෙදෙස්වලින් පැමිණි ජනතාව එම ශිෂ්ටාචාරය ගොඩනැගුවේ යැයි අදහසක් තිබේ.

රොමියුලස් රෝම නගරය තැනවීමේ ජනප්‍රවාදය

රජ පවුලක ඇති වූ කුමන්ත්‍රණයක් නිසා රාජ උරුමකරුවන් දෙදෙනෙකු වූ අලුත උපන් රොමියුලස් හා රීමස් නම් නිවුන් දරුවන් දෙදෙනෙකු දියේ ගිල්වා මැරීමට රජු අණ කොට ඇත. එම කටයුත්ත පැවරූ සේවකයාට දරුවන් පිළිබඳ අනුකම්පාවක් ඇති වී ලීවලින් සෑදූ තොටිල්ලක ඔවුන් පා කර හැරියේ ය. තම පැටවුන් මිය ගිය වෘක ධේනුවකට ගං ඉවුරේ දී මෙම දරු දෙදෙනා හමු වී තිබේ. වෘක ධේනුව විසින් දරුවන් තම ගුහාවට ගෙන ගොස් ඇති දැඩි කරන ලදි. පසුව මොවුන් ගොපල්ලෙකුට හමුවී තම දරුවන් මෙන් මොවුන් රැක බලා ගත්තේ ය. තරුණයන් බවට පත් වූ ඔවුහු තමන්ගේ ම රාජධානියක් ආරම්භ කිරීමට තීරණය කළහ. ඒ අනුව දෙදෙනා නගර ඉදි කිරීම ආරම්භ කළහ. එහි දී රොමියුලස් ඉදි කළ නගරය රෝමය ලෙස නම් කොට ඇතැයි ජනප්‍රවාදයේ සඳහන් වේ.

පාලන ක්‍රමය

මුල් කාලයේ දී රෝමයේ ගෝත්‍ර හෝ පවුල් පදනම් කරගත් පාලනයක් පැවැතිණැයි සැලකේ. අනතුරුව රාජාණ්ඩු ක්‍රමයක් ඇති විය. කලක් ගත වන විට රාජාණ්ඩුක්‍රමය ද පරිහානියට පත් වී, ක්‍රි. පූ. 509 දී පමණ රෝමයේ සමූහාණ්ඩු පාලන ක්‍රමයක් ආරම්භ විය. එම ක්‍රමය යටතේ කොන්සල්වරුන් ලෙස හැඳින්වූ නිලධාරීන් දෙදෙනෙකුට පාලන බලතල ලැබුණි. ඔවුන්ගේ කටයුතුවලට සහාය වීමට සෙනෙට් සභාවක් ද පැවතුණි.

මෙසේ රෝමය දේශපාලන වශයෙන් ඉදිරියට පැමිණීමත් සමග සමස්ත ඉතාලි අර්ධද්වීපය ම රෝම පාලනයට යටත් කෙරුණි. එබැවින් ක්‍රි. පූ. 1070 දී පමණ රෝම අධිරාජ්‍යය බිහි විය. පසුව ස්පාඤ්ඤය, එංගලන්තය, ප්‍රංශය හා මධ්‍යධරණී මුහුද අවට ප්‍රදේශ රෝම අධිරාජ්‍යයට ඈඳා ගත්තේ ය.

ක්‍රියාකාරකම

රෝම ව්‍යාප්ත සිතියමක ඉතාලි අර්ධද්වීපය, රෝම නගරය, ටයිබර් ගඟ, ඇල්ප්ස් හා ඇපිනයින් කඳු, මධ්‍යධරණී මුහුද, අද්‍රියාතික් මුහුද,පොම්පේ නගරය ලකුණු කරන්න.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

කීර්තිමත් රෝම අධිරාජ්‍යවරු

- ජුලියස් සීසර් යනු යුද්ධ කටයුතුවලට දක්ෂ රණශූරයෙකි.
- මුල් වරට රෝම අධිරාජ්‍යය ගොඩනගන ලද්දේ ජුලියස් සීසර් විසිනි.
- සීසර් යුක්තිගරුකව රෝම පාලනය මෙහෙයවා ඇත.

රූපය 5.10 ඔගස්ටස් සීසර්

ඔගස්ටස් සීසර්

- ඔගස්ටස් සීසර්ගේ පාලන සමය
- රෝම ඉතිහාසයේ ස්වර්ණමය යුගය ලෙස සැලකේ.
- රෝමයේ වැදගත් පැරණි ස්මාරක වන කොලෝසියම් ගොඩනැගිල්ල, කැරකැල්ලා නම් මහා නාන තටාකය මෙතුමාගේ කාලයේ ඉදි වී ඇත.
- ඔගස්ටස් සීසර්ගේ පාලන කාලයේ දී රෝම අධිරාජ්‍යයට අයත් ජෙරුසෙලම අසල බෙත්ලෙහෙමේ දී ජේසුතුමාගේ උත්පත්තිය සිදු වී තිබේ.

රූපය 5.11 මහා නාන තටාකය

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ජන ජීවිතය

රෝම පවුලක ප්‍රධානියා වූයේ පියා ය. ඔහු පවුලේ සියලු කටයුතු මෙහෙය වී ය. රෝම සමාජයේ කාන්තාවට ද විශාල බලයක් හිමි වූ අතර ඔවුන් සමාජයේ ඉහළ තනතුරු දරා ඇත. වෛද්‍ය වෘත්තිය වැනි උසස් වෘත්තීන්වල ද ඔවුන් නිරතව ඇත. මව පූජනීයත්වයෙන් සලකනු ලැබී ය.

සමාජය

ප්‍රභූන්, සාමාන්‍ය ජනතාව හා වහලුන් වශයෙන් සමාජය පුද්ගල කොටස් තුනකින් යුක්ත විය.

නගර නිර්මාණය හා නිවාස

සැලසුම් සහගත නගර ඉදිකර තිබිණි. ප්‍රභූ ජනතාව නගරවල සුඛෝපභෝගී නිවාසවල ජීවත් වූහ. ඇතැම්විට මහල් නිවාස ද ඉදිකර තිබිණි.

ජල පහසුකම් හා සෞඛ්‍යාරක්ෂාව ගැන විශේෂ සැලකිල්ලක් දක්වා ඇත.

සෑම නගරයක් ම මාර්ග ජාලයකින් සම්බන්ධකර තිබිණි. පාලම් තැනවීමේ ශිල්පය ගැන විශේෂ දැනුමක් රෝමවරු සතු වූහ.

රූපය 5.12

රෝමවරුන් යටත් කළ රටවලින් මිනිසුන් විශාල සංඛ්‍යාවක් සිරකරුවන් ලෙස රෝමයට ගෙන යන ලදි. මේ පිරිස් වහලුන් වශයෙන් ප්‍රසිද්ධ වෙළඳපොළේ දී විකුණූහ.

රූපය 5.13

රෝම ප්‍රභූවරු සමාජයේ ඉහළම කොටසට ඇතුළත් වූහ. ඔවුන් විසිතුරු මන්දිර වල ජීවත් වෙමින් සුඛෝපභෝගී ජීවිත ගත කළහ. එක් ධනවත් ප්‍රභූවරයෙකුගේ නිවෙසක සිය ගණනක් වහල්ලු ජීවත් වූහ.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

රූපය 5.14 පැරණි රෝම පාලමක්
(දුර ප්‍රදේශවල සිට නගරවලට ජලය ගෙන යාමේ දී ද රෝමවරු මෙබඳු පාලම් යොදා ගත්හ)

කලාව හා ගෘහ නිර්මාණ

ග්‍රීකවරු මෙන් ම රෝමවරු උසස් සාහිත්‍යකරුවෝ වූහ. උසස් ගද්‍ය පද්‍ය ග්‍රන්ථ රාශියක් රෝම ලේඛකයන් අතින් ලියවී ඇත. වර්ජිල් නම් කතුවරයාගේ ඊනිඩ් ඒවායින් එක් උසස් පද්‍ය ග්‍රන්ථයකි.

රෝමයේ ඉදිකර ඇති නාට්‍ය ශාලා, එළිමහන් රංග පීඨ එම වැසියන්ගේ කලාකාමී බව පෙන්වන නිදර්ශන වේ.

මූර්ති හා ප්‍රතිමා

විශිෂ්ට මූර්ති ශිල්පයක් හා ප්‍රතිමා කලාවක් රෝමවරු සතු වූහ. නීරෝ අධිරාජයාගේ යැයි සැලකෙන ලෝකඩ හිස, රෝම මූර්ති කලාවේ ජීවමාන ස්වරූපයට අගනා නිදසුනකි.

ගෘහ නිර්මාණ

රෝම කොලෝසියම රෝම නගරයේ ඉදිකොට ඇති එළිමහන් ක්‍රීඩාපිටියකි. මෙහි පුද්ගලයන් 50000 කට එකවර රැස් විය හැකි ය. මෙය ලොව පුදුම හතෙන් එකක් ලෙස සැලකේ.

පැන්තියන් දේවස්ථානය රෝමානු ගෘහ නිර්මාණයේ විශිෂ්ටත්වය පිළිබිඹු කරන විශාල ඉදිකිරීමකි. රෝමානුවන් ඇදහූ සියලු දෙවිවරුන් සඳහා මෙය ඉදි කර ඇත.

රෝමානුවන්ගේ ක්‍රීඩා

- ක්‍රීඩා කටයුතුවල යෙදුණු බවට සාධක විරලය.
- රෝමානුවන් රථ ධාවන තරග පැවැත්වූ බවට ද සාධක හමුව තිබේ.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

රූපය 5.15 රෝම කොලෝසියම

★ ඔවුන් සිංහයන් වැනි සතුන් යොදා ගෙන පැවැත්වූ කෲර, බිහිසුණු සටන්වලට ප්‍රියතාවක් දක්වා ඇත. මෙවැනි තරගවල දී, මිනිසුන් හා සතුන් සිය ගණනක් පමණ මිය ගොස් ඇති බව ඇසුව හොත් ඔබ පුදුම වනවා ඇත. මේවා සඳහා වහලුන් සහභාගි කරවා ගත් බව විශ්වාස කෙරේ.

වෙළෙඳ සබඳතා

රෝමය බොහෝ ධනවත් නගරයක් වූ අතර එය පෙර අපර දෙදිග වෙළෙඳ මධ්‍යස්ථානයක් විය. මධ්‍යධරණී මුහුද අවට රටවල් මෙන් ම ඉන්දියාව, චීනය හා ලංකාව වැනි ආසියාතික රටවල් සමග ද රෝම වෙළෙඳාම පැවැතිණි. රෝම වෙළෙඳුන් ලංකාව ගැන යම් යම් කරුණු සඳහන් කර තිබේ.

භාතිකාභය රජු රුවන්වැලිසෑයට පිදිම සඳහා රෝමයෙන් පබලු ගෙන්වූ බව මෙරට මූලාශ්‍රවල සඳහන් ය.

රෝම ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද

★ පාලම් තැනවීම, ජල නල එලීම, මං මාවත් තැනීමේ තාක්ෂණය රෝමවරුන්ගෙන් යුරෝපා ශිෂ්ටාචාරයට ලැබුණු දායාදයකි.

★ කිතුණු දහම රෝම ශිෂ්ටාචාරයේ පැතිරී පසුව ලොව පුරා ව්‍යාප්ත විය.

★ රෝම නීතිය

★ ලතින් භාෂාව

★ රෝම ගෘහ නිර්මාණ ශිල්පය

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

සාරාංශය

- ❖ ක්‍රීට දිවයින මුල් කරගෙන ග්‍රීක ශිෂ්ටාචාරය බිහි වීම.
- ❖ ඇතන්ස්, ස්පාටා වැනි පෞර රාජ්‍ය පැවතීම.
- ❖ කලාත්මක විද්‍යාත්මක හා දර්ශනික අංශයෙන් ග්‍රීකවරු උසස් තත්ත්වයට පත් ව සිටීම.
- ❖ වර්තමාන ලෝකයට පැරණි ග්‍රීක ශිෂ්ටාචාරයෙන් දායාද රැසක් උරුම වීම.
- ❖ ඉතාලියේ රෝම නගරය මුල් කරගෙන රෝම ශිෂ්ටාචාරය ආරම්භ වීම.
- ❖ මධ්‍යධරණී මුහුද අවට විශාල පෙදෙසක රෝම බලය පැතිරීම හා අධිරාජ්‍යයක් බිහි වීම.
- ❖ ග්‍රීකවරුන්ගෙන් පසුව යුරෝපයේ පැවැති දියුණු ම ශිෂ්ටාචාරය රෝමවරුන් යටතේ බිහිවීම.
- ❖ නූතන ලෝකයේ අභිවෘද්ධියට රෝම ශිෂ්ටාචාරයෙන් දායාද රැසක් ලැබීම.

ක්‍රියාකාරකම

1. ලෝක සිතියමක් ආධාරයෙන් ඉතාලි අර්ධද්වීපය, රෝම නගරය, ටයිබර් ගඟ, ඇල්ප්ස් හා ඇපිනයින් කඳු, එංගලන්තය, ප්‍රංශය, ස්පාඤ්ඤය හඳුනාගන්න.

2. රෝමානුවන්ගේ කලාත්මක නිර්මාණ, ගෘහ නිර්මාණ, ඉංජිනේරු තාක්ෂණික අංග ඇතුළත් පින්තූර පොතක් සකස් කරන්න.

3. ලංකාවේ තිබූ පුරාණ රෝම කාසි ප්‍රදර්ශනය සඳහා කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කර තිබේ. ඒවා නරඹා ඒ හා සම්බන්ධ තොරතුරු දැන ගන්න.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.